# ළමා අපයෝජනයේ ස්වභාවය පිළිබඳ විමසුමක්

ජේ.ඒ.එන්. අමාලි ජයකොඩි
සහකාර කථිකාචාරිනී, සමාජවිද්‍යා අධ්‍යයන අංශය
jan.amalijayakody@gmail.com

**සංක්ෂේපය**

ලොව ළමා අපයෝජනයට ලක් වූවන්ගෙන් හරි අඩක් තුන්වන ලෝකයේ රටවල ජීවත් වෙයි. එවන් සමාජ ප්‍රශ්නයක් වන ළමා අපයෝජනය පිළිබඳව අවධානය යොමු කරමින්, ළමා අපයෝජනයේ ස්වභාවය, එහි ඉතිහාසය, ළමා අයිතිවාසිකම්, ළමා අපයෝජනයේ ප්‍රබේද, ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය පිළිබඳ තත්ත්වය, ළමා අපයෝජකයන්ගේ ස්වරූපය, ළමා අපයෝජනයට ගොදුරු වූවන්ට අත් විඳින්නට වන ප්‍රතිඵල යනාදී මාතෘකා පිළිබ සංක්ෂිප්ත කරුණු විශ්ලේෂණයක් මෙම ලිපියේ අන්තර්ගත කෙරේ.

**හැඳින්වීම**

සංවර්ධිත මෙන්ම ඌන සංවර්ධිත යන කිසිඳු බේදයකින් තොරව සෑම රටකම සමාජ ගැටළු නිර්මාණය වෙයි. ගණිකා වෘත්තිය, සියදිවි නසා ගැනීම, ළමා අපයෝජනය, මත්ද්‍රව්‍ය දූර්භාවිතය, ජනවාර්ගික ගැටලු, ගෘහස්ථ හිංසනය යනාදී සමාජමය ගැටලු නැතහොත් සමාජ ප්‍රශ්න රැසක් නූතන ලෝකයේ ක්‍රියාත්මක වෙමින් පවති. මෙම සමාජ ප්‍රශ්න අතරින් ප්‍රබලව සමාජයට බලපෑමක් එක් කරන්නා වූ සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය හඳුන්වා දිය හැක. නූතන ශ්‍රී ලාංකික සමාජ තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී පුවත්පත්, රූපවාහිනිය, අන්තර්ජාලය ඇතුළු ජනමාධ්‍ය තුළින් ළමා අපයෝජනයේ දරුණුතම තත්ත්වය හඳුනාගත හැකි අතර මෙම ලිපිය සැකසෙන්නේ මූලිකවම ළමා අපයෝජනයේ ස්වභාවය පිළිබඳව වෙයි.

**ළමා අපයෝජනය**

සමාජ ප්‍රශ්න රැසක් සීඝ්‍රව වර්ධනය වෙමින් පවතින යුගයක අනාගත ලොවෙහි කිරුළු දරන්නට සිටින ළමා පරපුර කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කරන්නා වූ, සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය හඳුන්වා දිය හැකිය. සමාජය තුළින් උපත ලබා සමස්ත සමාජයටම අහිතකර බලපෑම් කරන්නාවූද, වැඩිදෙනෙක් තුළ නිරතුරු අවබෝධයක් ඇත්තාවූද, එකී අහිතකර සමාජ වාතාවරණය වෙනස් කිරීමේ ඕනෑකමක් ඇත්තාවූ ද, ගතික සිදුවීම් මාලාවක් සමාජ ප්‍රශ්නයක් ලෙස හැඳින්වේ (අමරසේකර,1996,පි.107). එවැනි සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය කැපී පෙනෙයි. බහුතරයක් සමාජ ප්‍රශ්න. ළමා අපයෝජනය යන සමාජ ප්‍රශ්නය සමඟ සම්බන්ධව පැවතීම එයට හේතුවයි. ළමයාට එරෙහිව සිදුවන අපචාර වත්මන් ලෝකය පුරාම සමාජ සංවර්ධනයදී ප්‍රබල ගැටලුවක්ව ඇති බව පෙනීයයි. විශේෂයෙන්ම නූතනයේ ළමා අපයෝජනය හා බැඳී ඇති කලාප වන්නේ නැගෙනහිර ආසියාව හා දකුණු ආසියාවයි. නැගෙනහිර ආසියාවේ තායිලන්තය, පිලිපීනය, ඉංදුනීසියාව ද, දකුණු ආසියාවේ ශ්‍රී ලංකාව හා ඉන්දියාව ප්‍රධානය (අමරසේකර:2005,පි.25).

මෙම බරපතල සමාජ ගැටලුව පිළිබඳ විමසා බැලීමේදී, ළමයා යනු කවරෙක්ද?, අපයෝජනය යනු කුමක්ද යන්නත්, එයින් සමාජයට කුමනාකාරයේ බලපෑමක් සිදුකරයිද? යන්න හඳුනා ගැනීම ප්‍රමුඛ වේ.

ළමයා හඳුනා ගැනීම සඳහා විවිධ රටවල්, විවිධ ආයතන, සංවිධාන, පනත් විසින් නිර්වචන රැසක් ඉදිරිපත් කර තිබේ. ඒ විවිධ දෘෂ්ටිකෝණයන් යටතේ වුවත්, එම අර්ථකථනයන් බොහෝමයකට මූලික වශයෙන් පදනම වී ඇත්තේ වයස් සීමාවන් හා කාර්ය කොටස් අතර පවතින සම්බන්ධතාවයන්ය.

"ඒ ඒ රටෙහි නීතිය විසින් දරුවෙකු වයෝපූර්ණ භාවයට පත්වීමේ පූර්ව වයස් සීමාවක් නියම කර ඇත්තේ නම් මිස අවුරුදු 18 කට අඩු සෑම අයෙකුම ළමයෙකු ලෙස සැලකේ " (එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය). මෙම අර්ථ දැක්වීමට අනුව ළමයෙකු යම් රටක නීතියෙන් දක්වා ඇති වයසක් තිබේ නම් පමණක් හෝ එසේ නැතිනම් අවු:18ට අඩු සෑම අයෙක්ම ළමයෙකු ලෙස හඳුන්වයි. එසේ වුවත් ප්‍රායෝගිකව අවධානය යොමු කිරීමේදී ළමයා යන්න අර්ථකථනය කළ හැකිද යනුවෙන් ගැටළුවක් මතුවේ. සාමාන්‍ය ව්‍යවහාරයේදී, සමාජය ළමයා යන්න අර්ථකථනය කරනු ලබන්නේ, ජීව විද්‍යාත්මක වශයෙන් ද්විතීයික ලිංගික ලක්ෂණ පහළ නොවූ පුද්ගලයන්ය. නමුත් රටක නෛතික රාමු තුළින් තවත් අයුරකින් ළමයා නිර්වචනය කරයි. නිදසුනක් ලෙස ලංකාවේ දණ්ඩනීති සංග්‍රහයට අනුව එක් එක් අපරාධ සඳහා විවිධ වයස් කාණ්ඩවල සිටින අය ළමුන් ලෙස හඳුන්වයි. එනම් ලිංග භේදයකින් තොරව අවු:10, 12, 14, 16, 18 යනාදී වසස් කාණ්ඩවලට අයත් පුද්ගලයින් ළමුන් ලෙස හඳුනාගැනෙයි. එහිදී පැනනගින ගැටළුව නම් වයස් සීමාවෙන් පමණක් ළමයෙකු යන්න අර්ථකථනය කළ හැකිද යන්නයි. නෛතික රාමුවට ඔබ්බෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ,මානසිකත්වය, චර්යා රටා ආදිය මෙහිදී වැදගත් වන බවද සුවිශේෂීව හඳුනාගත යුතුය.

ලෝකය පුරාම ළමයින් සම්බන්ධ ගැටළු, ආරවුල්, හිරිහැර, අපයෝජන වැඩිවීමත් සමඟ ළමයින් යනු කවුරුන්ද?, කුමන වයස් සීමාවලට අයත් අයද? යන්න හඳුනාගන්නට විවිධ රටවල් උත්සාහ දැරූහ. එහි ප්‍රතිඵලයක් ලෙස 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය හඳුන්වා දිය හැකිය. ජිනීවා ප්‍රකාශනයත්, එක්සත් ජාතීන් විසින් සම්මත කරගත් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් පරිදි 1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතින්ගේ මහා මණ්ඩල රැස්ව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය යනුවෙන් ගිවිසුමක් ඇතිකරගන්නා ලදී. එදින එම අවස්ථාවට සහභාගී වූ රටවල් 193 ක් අතුරින් 191ක්ම එම ගිවිසුමට එකඟ විය. ශ්‍රී ලංකාව ද 1991 දී එම ගිවිසුමට ඇතුළත්ව ඇති අතර වගන්ති 54කින් එම ව්‍යවස්ථාවට ඇතුළත්ය (කුරේ,2007). නමුත් ක්‍රියාත්මක වීම පිළිබඳ විමසා බැලූවිට සංවර්ධිත රටවල පමණක් වැඩි වශයෙන් පිළිගැනීමක් ඇති බවත් , අලුත උපන් බිළිදාගේත් වයස අවු:17 ක යෞවනයාගේත් අයිත්වාසිකම්වල වෙනසක් නැතිබවට විවේචනයන් ද පවතින බවත් හඳුනා ගත හැක.

ශ්‍රී ලංකාවේ ළමා හා තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥා පනතට අනුව ළමයා යනුවෙන් නිර්වචනය කර ඇත්තේ වයස අවු:14 ට අඩු පුද්ගලයින්ය.

Child :

1. Young human being below the age of puberty
2. Unborn or newborn human being
3. One’s son or daughter

(Oxford, 1992, p.141)

ද්විතීයික ලිංගික ලක්ෂණ පහළ නොවූ, නූපන් හෝ අලුත උපන් දුව හෝ පුතා යන්න මෙයින් අදහස් කෙරේ. එසේම ළමයෙකු යනු වගකීම් රහිත තැනැත්තෙකු වන බවත් ඕනෑම වයසක දුවකු පුතෙකු යන්නත්, සුවිශේෂී සමාජයන් පිළිබඳ අත්දැකීම් විරහිත කුඩා පුද්ගලයන් ලෙසත් වෙනත් අයුරකින් නිර්වචනය කළ හැක.

ලංකාවේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1995 අංක 22 දරණ දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනතේ 286 (ඇ) 2 වගන්තීන් හා 1998 අංක 29 දරණ දණ්ඩනීති සංග්‍රහයේ 288 (ආ) 2 උපවගන්තිය යනාදිය තුළ ද ළමයා අවු:18ට අඩු තැනැත්තන් බව පෙන්වා දෙයි. ඒ අනුව ලොව පුරා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා විවිධ පනත්, ප්‍රඥප්ති ඉදිරිපත් වී ඇති බව ද පෙනෙයි.

1. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය-1989
2. ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය- 1924

3. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය-1948
4. සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

යනාදී දෑ නෛතිකවම ක්‍රියාත්මක වන අතර UNESCO, UNISEF,UNO යනාදී සංවිධානයන් ද මේ සඳහා ඇපකැප වී සිටින බවද හඳුනාගත හැකිය. මීට අමතරව ශ්‍රී ලංකාවේ පමණක් අණ පනත් රාශියක් ක්‍රියාත්මක වෙයි. ඒ අතර 1998 අංක 27 දරන අධිකරණ (සංශෝධන) පනත, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පනත, 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යනාදිය ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වෙයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් යටතේ ද, ලංකාව බැඳී සිටින නොයෙකුත් ලෝක සංවිධාන වල ප්‍රඥප්තීන්හි ද ළමයෙකුට අයිතීන් විශාල ප්‍රමාණයක් හිමි විය.

- දෙමව්පියන් හෝ භාරකාරයින්ගේ විසි රැකවරණයට පත්වීම, එසේ නොවන අවස්ථා වලදී රාජ්‍ය මැදිහත් වීමෙන් රැකවරණය ලබා ගැනීම.
- ළමයා හැඳින්වීමට නීත්‍යානුකූල නමක්, ආගමක්, පුරවැසිභාවයක් හිමිවීම.
- ඔහුගේ හෝ ඇයගේ යහපතට හානියක් නොවන්නේ යැයි අධිකරණය පිළිගන්නා තුරු, මව්පිය භාරකරුවන්ගෙන් වෙන් නොවීම.
- ජාතිය, ආගම, කුලය හෝ කුමන පදනමකින් හෝ වර්ග නොකිරීම, කොන් නොකිරීම, සමාජයෙන් ඈත් නොවී සිටීම.
- මත ප්‍රකාශ කිරීම, අදහස් ප්‍රකාශ කිරීම හා කුසලතා එළි දැක්වීම.
- අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන අයුරින්, අපහාස නොවන අයුරින්, තොරතුරු දැන ගැනීම හා අදහස් ප්‍රකාශ කිරීම.
- ඔහුගේ ඇයගේ හෘදසාක්ෂියට හා චින්තනයට එකඟව භාරකරුවන්ගේ මග පෙන්වීම මගින් ආගමක් ඇදහීම හෝ විශ්වාස කිරීම.
- සමවයස් ළමුන් සමඟ ඇසුරු කිරීම, විනෝද වීම, සෙල්ලම් කිරීම, අදහස් හුවමාරු කර ගැනීම.
- ලෙඩ රෝගවලදී ආරක්ෂා වීම, ප්‍රතිශක්තිකරණය ලබා ගැනීම හා නිසි ප්‍රතිකාර ලැබීම.
- ජීවත්වන රට, ප්‍රදේශය හා සංස්කෘතියට අනුව නිසි ලෙස පෝෂදායි ආහාර පාන, ඇඳුම් පැළඳුම් නිවාස පහසුකම් ලැබීම.
- අධ්‍යාපනය ලැබීම හා කුසලතා වර්ධනය කර ගැනීම.
- විවේකය, නිදහස හා ස්වාධීනත්වය.
- සංස්කෘතික කලා කටයුතු වලට සහභාගී වීම හෝ ඉදිරිපත්වීම.
- ළමා කාලය ඉක්මවන තුරු භාරකරුවන්ගෙන් රැකවරණය සහ සියලුම පහසුකම් ඉටුකර ගැනීම.
- සියලුම ආකාරයේ අපයෝජන වලින් ආරක්ෂා වී සිටීම හා එසේ නොවන ආකාරයේ රැකවරණයක් ලැබීම.

(කුමාර, 2001 ,පි-4-11)

ඉහත දක්වන ලද්දේ 1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අයත් වගන්ති කිහිපයක් සරලවය. මේ ආදී වූ කෙතරම් අයිතිවාසිකම් ළමුන් වෙනුවෙන් තිබුණ ද, ළමයා විවිධාකාරයෙන් නිර්වචනය කළ ද, වත්මන් පීඩාකාරී සමාජ ආර්ථික පරිසරය තුළ එම අයිතීන් සුරැකෙන්නේ ද? යන ප්‍රශ්නාර්ථය අප හමුවේ පවතී. ළමයා සඳහා මෙසේ ඇති අයිතිවාසිකම් ලබා නොදීම/මග හැරීම යන කරුණු කාරණා ගත් කළ එය අපයෝජනය යනුවෙන් හැඳින්වීම ද නිරවද්‍ය වේ.

ළමයාගේ අයහපතට හේතුවිය හැකි යමක් කිරීම හෝ ළමයාගේ යහපතට හේතුවිය හැකි දෙයක් නොකර සිටීම ළමා අපයෝජනයයි (පෙරේරා, 2011, පි.70). උක්ත නිර්වචනය අනුව ළමයෙකු

අපයෝජනයට ලක් වීම යම් ක්‍රියාවක නිරතවීමෙන් මෙන්ම නොවීමෙන් ද සිදුවෙයි. ළමා අපයෝජනය සිදුවන්නේ චේතනාත්මකව කරන ක්‍රියා මගින් වුවත් නොදැනුවත්ව සිදුකරන ක්‍රියා මගින් ද අපයෝජනය සිදු වෙයි. එසේම ළමයාට අනර්ථයක් සිදුවන ආකාරයෙන් සැලකීම හෝ ක්‍රියා කිරීම ළමා අපයෝජනය ලෙස ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය සඳහන් කරයි. එනම් දරුවන් වැරදි ක්‍රියාවන් සඳහා යොදවා ගැනීම, දරුවන්ගේ සෞඛ්‍යයට හෝ පැවැත්මට, ගරුත්වයට හෝ සංවර්ධනයට හානි වන අයුරින් නොමනා ක්‍රියාවන්හි දරුවන් යොදා ගැනීම හා පෙළඹවීම අපයෝජනය ලෙස අර්ථ දැක්වේ. එහිදී හඳුනාගත හැකි කරුණක් නම් දරුවන් මෙසේ අපයෝජනයට ලක්වීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් විය යුත්තේ දෙමාපියන්/ භාරකරුවන්ය යන්නයි.

**ළමා අපයෝජනයේ ඉතිහාසය**

ළමා අපයෝජනය සියවස් ගණනාවක් පුරා රහසේ ව්‍යාප්ත වූ උවදුරකි. එහෙත් එය බරපතල සමාජ පිළිලයක් බවට හඳුනාගෙන ඊට එරෙහි වීමට තරම් අවධානයක් යොමුවූයේ මෑත දශක කීපයක සිටය. 80 දශකය මැද භාගය වන විට ළමා අපයෝජනය දණ්ඩනීය වරදක් බවත් 90 දශකය මුල්භාගය සිට ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවත් හඳුනා ගැනුණි (ළමා අපයෝජනයට වැට බඳිමු, 1995, පි.03). ඒ අනුව, මෑතක් වනතුරුම ළමා අපයෝජනය යනුවෙන් යමක් සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ලෝක ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කිරීමේදී වුව ද 'ළමයින්' සුවිශේෂී පිරිසක් ලෙස ද හඳුනාගෙන නොතිබුණි.

ගෝත්‍රික යුගයේදී ළමුන් බිලි පූජා සඳහා, ලිංගික කටයුතු සඳහා, අවදානම් වූ සතුන් දඩයම් කිරීම සඳහා, යුධ කටයුතු වලට, වහල් මෙහෙකාර සේවයට කාලානුරූපීව යොදා ගන්නා ලදී. දරුවන් එසේ වැඩකටයුතු වලට යොදා ගත්ත ද එය ළමා අපයෝජනය ලෙස හඳුනාගෙන නොතිබිණි. නිදසුන් ලෙස මෑත කාලීනව ද නොයෙක් රටවල පවතින ගෝත්‍රික කණ්ඩායම් වල පූජා විධි චාරිත්‍රවාරිත්‍ර ආදිය නිසා ළමුන් අපයෝජනයට ලක්වන ආකාරය පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම යම් වරදක් වූ විට වැසියන්ට සේම දරුවන්ට ද දඬුවම් දීම කළේය. ඉතා ලාබාල දැරිවියන්, වැඩිහිටි කැමැත්ත මත හැඩි දැඩි වයෝවෘද්ධ පුද්ගලයින්ට විවාහ කර දීමෙන්, ගෝත්‍රික යුග වල්දී දැරියන්ට සිදුවූ වේදනාකාරී ලිංගික සූරාකෑම සම්ප්‍රදායක් විය. කුඩා කල සිටම දරුවන් බිහිකිරීමට වීම හා ඇති දැඩි කිරීම තුළ ඔවුන්ගේ ළමා කාලය උදුරා ගැනීම ආදිය පැරණි ගෝත්‍රික සමාජ වල සිදුවිය. නිදසුන් ලෙස සෝමාලියාවේ කුඩා ගැහැණු දරුවන් චර්මඡේදනයට ලක් කිරීම, ඕස්ට්‍රේලියාවේ අරුන්ටා ගෝත්‍රිකයින් විසින් පිරිමි ළමුන් වැඩිවිය පැමිණීමේ චාරිත්‍ර වාරිත්‍ර කිරීමේ දී සිදුවන හානිකර තත්ත්වයන් පෙන්වාදිය හැක.

ගෝත්‍රික යුගයෙන් පසුකාලීනව ශතවර්ෂ ගණනක් මුළුල්ලේ ක්‍රියාත්මක වූ වහල් මෙහෙය තුළත්, එම වහල් මෙහෙයේ නියුතු දෙමව්පියන්ගේ දරුවන් ද වහල් කඳවුරු වලම ඉපිද වහල් සේවයේ යෙදෙමින් හැදී වැඩුණි. විවිධ ආගමික ශාස්තෘවරුන්ගේ උත්පත්තීන් සමග ද මෙය බැදී ඇත්තකි. එනම් ක්‍රිස්තුස් වහන්සේ මෙලොව උපත ලැබීමත් සමග ජේසු නම් දරුවා සොයා මැරවීම පිණිස එවකට රෝමයේ සිටි රාජ්‍ය නායකයෝ කිරිදරුවන් විශාල වශයෙන් සංහාරයට ලක් කිරීම සිදුකළෝය. පළමු හා දෙවන ලෝක යුද සමයන්හිදී දරුවන් අපයෝජනයට, මරණයට, වසංගත රෝග වලට ගොදුරු වීම සේම මානසික හිංසනයන්ට ගොදුරු වන්නට විය. නූතනයේ අපයෝජනය යනුවෙන් මෙම පීඩාවන් හඳුනාගෙන තිබුණත් අතීතයේ එසේ නොවීම විශේෂයකි. බුදුන්ගේ සමයෙහි සුනීත, සෝපාක යන දරුවන්ගේ කතා පුවත් වලින් ද එය හෙළිවෙයි.

ශ්‍රී ලංකාව තුළ අපයෝජන ඉතිහාසය විමසා බැලීමේදී රජවරුන්ගේ පාලන කාලයන් තුළ ළමුන් ලෙස හැඳින්වූයේ පෙර දැක්වූ පරිදි ද්විතීයික ලිංගික ලක්ෂණ පහල වීමට පෙර අවධියයි. නමුත් ගැහැණු දරුවකු වැඩිවිය පැමිණීමත් සමග වැඩිහිටියන්ට අවශ්‍ය පරිදි ඔවුන්ව විවාහපත් කර දෙන්නට විය. ඇතැම් විටෙක එය ලාබාල දැරිවියක දූෂණය කිරීමක් ලෙස වත්මන් නීති ප්‍රකාර අනුව හඳුන්වා දිය හැක. ඓතිහාසික කතා පුවත්වලට අනුව රාජකීය යුගයන්හි රටවැසියන් අතර රූමත් දියණිවරුන් සිටී නම් අන්තඃපුරයට කැඳවා ගනී. ඉන්දියාවේ දියණියන් ලැබීම ශාපයක්/විපතක් ලෙස සලකා ඔවුන්ව මරා දැමීමට කටයුතු කළ අතරම ලංකාවේ රූමත් දියණියන්

ලැබීම විපතක් ලෙසද ලාංකිකයෝ දුටහ. 70, 80 දශකයේ පැන නැගුණු සමාජ පංති ක්‍රමය හේතුවෙන් උසස් යැයි සම්මත ප්‍රභූ පැළැන්තීන් විසින් දුප්පත් දරුවන් මෙහෙකාර සේවයටත් ලිංගික සූරාකෑම් සඳහාත් යොදා ගත් බව ලක් වැසියාට නොරහසකි. මෙම කරුණු තුළින් පූර්ව යුගයන්හි ළමා අපයෝජනය නොදැනුවත්ව සිදුවූ බව හඳුනා ගත හැක.

ලංකා ඉතිහාසයේ පමණක් නොව ලොව පුරාම ප්‍රචලිත ළමා අපයෝජන සිදුවීමක් ලෙස ඇහැලේපොළ දරුවන් මැරවීම හඳුන්වා දිය හැක. මද්දුම බණ්ඩාර සහ ඔහුගේ සහෝදරයාගේ හිස ගසා දැමීමටත් කුඩා දරුවා වංගෙඩියේ දමා කෙටීමටත් දරුණු ගණයේ ළමා අපයෝජන ලෙස වත්මනේ හැඳින්විය හැක්කේ ළමයා යන්න නූතනයේ නිර්වචනය කර තිබීමත්, ඔවුන් වෙනුවෙන් අයිත්වාසිකම් හඳුන්වා දීමත් සමඟය.


**ළමා අපයෝජනයේ ප්‍රභේද**

ළමා අපයෝජනය යන්න පළමුව භාවිත කර ඇත්තේ 1980 දී බ්‍රිතාන්‍ය චක්‍රලේඛනයකයි. (Corby,2000,p.71) නමුත් ළමා අපයෝජන වර්ග පිළිබඳ පැහැදිළි අදහසක් ඉදිරිපත් කිරීමට ද එම යුග වලදී ද නොහැකි වී තිබුණි. 1988 දී මෙය පස් ආකාර වර්ග කිරීමක් තිබුණි.

1. ශාරීරික අපයෝජනය
2. නොසලකා හැරීම
3. චිත්තවේගී අපයෝජනය
4. ලිංගික අපයෝජනය
5. බරපතල වැඩ දීම

(Corby, 2000, p.7)

ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කිරීමේදී විවිධ අවස්ථාවන්හි කරන ලද වර්ගීකරණයන් රැසක් හඳුනා ගත හැකි වෙයි. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින්, ශාරීරික අපයෝජනය, ලිංගික අපයෝජනය, මානසික අපයෝජනය, නොසලකා හැරීම යනුවෙන් අපයෝජනය වර්ග කර දක්වන නමුත් පොලිස් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් ළමා අපයෝජනය පිළිබඳ අත් පොතෙහි ඉහත විග්‍රහයන්ට සාපේක්ෂව පුළුල්ව ප්‍රභේද කිහිපයක් ඉදිරිපත් කරයි




(ළමා අපයෝජනය පිළිබඳ අත්පොත, 1995, පි.7)

මෙම සියලු ප්‍රභේද ඒකරාශී කොට, විස්තරාත්මකව ළමා අපයෝජනය පහත අයුරින් විග්‍රහ කළ හැකිය.

1. ශාරීරික අපයෝජනය

පහර දීම, සෙලවීම, තල්ලු කිරීම, වස විස දීම, පිළිස්සීම, බැන වැදීම, වැට්ටීම, හුස්ම හිර කිරීම හෝ කායික වශයෙන් දරුවන්ට හානිකර දෑ කිරීම කායික අපයෝජනයයි. දෙමව්පියන් විසින් දරුවන්ට හානි පමුණුවා ව්‍යාජ අසනීපයන් පෙන්වීම මඟින්ද සිදුවිය හැකිය. එසේම අතෘප්තිකර හා මානසික පීඩනයෙන් සිටින දෙමාපියන්, භාරකරුවන් හෝ ඕනෑම වැඩිහිටියකගේ කායික වද හිංසාවකට ලක් විය හැකි අතර නිවසේ, පාසලේ, පවුල තුළ සිදුවිය හැකිය (Corby, 2000). මෙම අර්ථකථනය මඟින් ශාරීරික අපයෝජනය කායික අපයෝජනය ලෙසින් ද සඳහන්වන බැව් හඳුනා ගත හැකිය. ලෝකයේ බොහෝ රටවල ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන කායික හිංසා ක්‍රියාවන් අපරාධ නීතිය හෝ වෙනත් නීති සංග්‍රහයන් මඟින් වරදක් ලෙස සැලකීම තුළ මෙවැනි ක්‍රියා අපරාධ ගණයට ද අයත් වෙයි.

මෙහෙකාර සේවයේ යෙදවීම, පැහැරගෙන යාම, වෙළඳාමේ යෙදවීම යනාදියත් ශාරීරික අපයෝජන ප්‍රභේදයටම අයත් වේ. ඕනෑම ජාතියකට අයත් ඕනෑම ආගමක් අදහන හා ඕනෑම ආර්ථික, සමාජීය කණ්ඩායමකට අයත් ළමයින් ගොදුරු වීමට ඉඩ ඇත. එහෙත් දිළිඳු හා ඌන සම්පත් හිමි, ගැටුම්කාරී තත්ත්වයන් සහිත පවුල් තුළ ළමුන් මෙයට ගොදුරු වීමේ ප්‍රවණතාවය වැඩි බවක් දක්නට ලැබෙයි. දරුවන් මේ අයුරින් හානියට ලක් වීම තුළ ඔවුන්ගේ සංවර්ධනයද අඩාල වෙයි. අවුඃ 03ට අඩු දරුවන් මෙසේ තුවාලයන්ට ගොදුරු වීම අධිකරණ වෛද්‍ය විද්‍යාවට අනුව Batterd Baby Syndrome යනුවෙන් ද අවුඃ 03-10ත් අතර දරුවන් Batterd Child Syndrome යනුවෙන්ද හඳුන්වයි (www.medicinenet.com)

2. ලිංගික අපයෝජනය

ළමයාට එරෙහි අපයෝජන තත්ත්වයන් අතරින් ලිංගික අපයෝජනය බරපතල ගැටළුවක් ලෙස වත්මන් සමාජ තත්ත්වය දෙස අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැක. ලිංගික ක්‍රියාකාරකමක යෙදීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට මානසික හා ශාරීරික පරිණතභාවය ලබා නොමැති වීම මෙන්ම ඊට සම්බන්ධවන අනෙක් පුද්ගලයා තරමටම එම ක්‍රියාකාරකම් ගැන දැනුමක් අවබෝධයක් අත්දැකීමක් නොමැති ළමයෙකු එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ලිංගික ක්‍රියාකාරකමකට සම්බන්ධ කර ගැනීම ලිංගික අපයෝජනය වේ (www.pandys.org).

එනයින් ගත් විට,

1. බලහත්කාර ළමා ලිංගික අපයෝජනය
2. කැමැත්තෙන් හෝ කැමති කරවාගෙන සිදුකරනු ලබන ළමා ලිංගික අපයෝජනය

(කුරේ, 2007, පි.63)

යනුවෙන් කොටස් දෙකකින් ළමා ලිංගික අපයෝජනය හඳුනාගත හැකිය. මෙය සිදුවිය හැක්කේ ළමයෙකු වෙතින් ලිංගික තෘප්තියක් ලබන වැඩිහිටියෙකු හෝ ඉහළ වයස් මට්ටමේ ළමයෙකු හෝ තවත් දරුවකු අතර වේ. ලිංගික අපයෝජනයේදී ළමයාගෙන් තෘප්තියක් සේම ළමයා යම් ලිංගික ක්‍රියාවකට පොළඹවා එය නැරඹීම මඟින් ද අපයෝජකයින් ළමුන්ව අපයෝජන කාර්යයට යොදා ගනු ලබයි. ඕනෑම වයස් කණ්ඩායමකට අයත් ළමුන් ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව ලිංගික අපයෝජනයට ගොදුරු වෙති. නමුත් විශේෂයෙන්ම නිසි භාරකාරත්වයක් හෝ රැකවරණයක් නොමැති ළමුන්, සන්නද්ධ සේවයේ යෙදී සිටින ළමුන්, සුජාත නොවන ළමුන් සහ දිළිඳු මෙන්ම බිඳුණු පවුල්වල ළමුන් ලිංගික අපයෝජනයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් පවතින බව බොහොමයක් විද්වතුන් විසින් පිළිගන්නා අදහසකි. මෙම ලිංගික අපයෝජනය ස්වරූප දෙකකින් සිදුවෙයි.

1. ස්පර්ශණීය ලිංගික අපයෝජන ක්‍රියා

- ලිංගික ප්‍රදේශය ස්පර්ශ කිරීම.
  - උදා: තට්ටම, අධෝමාර්ගය, රහස් අවයව, ලැම, මුඛය ස්පර්ශ කරවා ගැනීම.
- කාමුක ආකාරයට සිප වැළඳ ගැනීම.
- කුට්ටනය කිරීම/දූෂණය/ව්‍යභිචාරය.

2. අස්පර්ශණීය ලිංගික අපයෝජන ක්‍රියා

- අසභ්‍ය ඡායාරූප වීඩියෝ පෙන්වීම.
- අසභ්‍ය දුරකථන හඬවලට සවන් දීමට බල කිරීම/ සැලැස්වීම.
- කාමුක  අසභ්‍ය වීඩියෝවලට පෙනී සිටීමට බල කිරීම/ සැලැස්වීම.
- ලිංගික අවයව ප්‍රදර්ශනය කිරීම.

(පෙරේරා,2011)

මේ අයුරින් අපයෝජනකයින් විසින් ළමුන්ගෙන් ලිංගික ආශ්වාදය ලැබීම මෙන්ම ආර්ථික ප්‍රතිලාභ යනාදිය අරමුණු මූලික කරගෙන සිදුවෙයි. ළමුන් උපයෝගී කරගනිමින් ලිංගික ආශ්වාදය ලබා ගන්නා පුද්ගලයන් දහර කාමුක හෙවත් කෞමාරකාමුකයන් ලෙස හැඳින්වේ. මොවුන් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව කුඩා ළමුන් ඇසුරින් ලිංගික තෘප්තිය ලබන්නට උත්සාහ දරන්නෝ වෙති. මෙවන් පුද්ගලයන්ගෙන් 75% පමණ කුඩා කාලයේදී ලිංගික අතවරයන්ට ලක් වූවන්ය (විමලසූරිය, 2000, පි.10). ව්‍යාපාරික මට්ටමෙන් මුදල් පරමාර්ථ කර ගනිමින් ළමුන් ලිංගික ක්‍රියාවන් සඳහා යොමු කරවීම සිදුවේ. වෙරළබඩ ප්‍රදේශවල දරුවන් මෙන්ම මුඩුක්කුවාසී දරුවන් ද මෙයට ගොදුරු වෙයි. විදේශීය සංචාරකයින්ගේ ලිංගික ආශාවන් තෘප්ත කිරීමට Beach boys හෝ Beach girls යනුවෙන් ළමුන් ඇතැම්විට දෙමාපිය අනුදැනුම මත ද  මුදල් පරමාර්ථ කර ගනිමින් යොමු වී තිබෙයි.
මෙම කරුණු අනුව ළමයාගේ ආරක්ෂාව අයිතිවාසිකම් පිළිබඳව විවිධ අයුරින් පැවසුන ද කුමන ස්ථානයේදී ඔවුන්ගේ ආනාරක්ෂාව, අයිතිවාසිකම් අහිමි වීම සිදුවේදැයි කිව නොහැකිය.

3. **චිත්තාවේගී අපයෝජනය**

යම් ක්‍රියාවක් හෝ ප්‍රකාශයක් හේතුවෙන් ළමයෙකුහට යම් මානසික පීඩනයක් හෝ කම්පනයක් ඇතිවේ නම් එය සරලව චිත්තාවේගී අපයෝජනය ලෙස හැඳින්විය හැක. චිත්තාවේගාත්මක ළමා අපයෝජනය මගින් සිදුවනුයේ ළමයාගේ චිත්තාවේගික සංවර්ධනයට බාධා පැමිණවීමයි.

ළමයාට ආදරය නොකිරීම, ආදරය ප්‍රකාශ නොකිරීම, කොන්දේසි මත ළමයා ළමයාට ආදරය කිරීම, සෙසු අය ඉවත් කර එක් ළමයෙකුට ආදරය කිරීම, දෙමාපිය වැරදි ක්‍රියා වලට ළමයා යොදා ගැනීම, පවුලේ විවිධ ගැටුම්කාරී තත්ත්වයන්, යනාදිය  නිසාවෙන් ළමුන් තුළ චිත්තාවේගීමය අපයෝජනය සිදුවිය හැක. විශේෂත්වය වන්නේ මෙම අපයෝජන ස්වරූපය දැනුවත්ව හෝ නොදැනුවත්ව ද සිදුවිය හැකි වීමයි.

- නොසලකා හැරීම.
- වේදනාවට පත් කිරීම.
- බැන වැදීම.
- නිසි වෙලාවට ආහාර නොදීම.
- කායිකව සිදු කරන අපයෝජන.
- ළමයා හුදකලා කිරීම/ තනි කිරීම.
- ළමයා විවේචනය කිරීම.

- අවමානයට පත් කිරීම.
- තර්ජනය කිරීම.
- ළමයාට ඉසිලිය නොහැකි තරම් වැඩ රාජකාරි පැවරීම හෝ ඔරොත්තු නොදෙන බලාපොරොත්තු ඇති කිරීම.
- සමාජ විරෝධී චර්යාවන් සඳහා මෙහෙය වීම.

මෙම සියලු ක්‍රියාවන් තුළින් සිදුවන්නේ දරුවන්ගේ සංවර්ධනයට බධාකාරී බලපෑමක් එල්ල වීමයි. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ, ශාරීරික මෙන්ම ශාරීරිකමය නොවන ප්‍රතික්ෂ්ප කිරීම් හෝ එදිරිවාදිකම් කරමින් සැලකීම හරහා හුදකලා අවස්ථාවන්හි හෝ කාලයක් තිස්සේ රටාවක් ලෙස බොහෝ අවස්ථාවන්හි දරුවාගේ සංවර්ධනයට අදාල සුරක්ෂිත බව ලබාදෙන පරිසරයක් සැපයීමට දෙමාපියන් හා රැකබලාගන්නන්ට නොහැකි වීම මත මෙම අපයෝජනය සිදුවන බවයි. අපයෝජන ප්‍රබේදයන් අතරින් දරුවන්ට බරපතල බලපෑමක් ඇති කරන්නක් ලෙස චිත්තාවේගී අපයෝජනය හැඳින්විය හැකිය.

**4. නොසලකා හැරීම**

නොසලකා හැරීම සිදුකරනු ලබන්නේ දෙමව්පියන් හෝ ළමයාගේ භාරකරුවන් විසිනි. ළමුන්ගේ ආහාර, නිවාස, ආරක්ෂාව, ඇඳුම්-පැළඳුම්, වෛද්‍යමය ප්‍රතිකාර ඇතුළු ශාරීරිකමය, සෞඛ්‍යමය, සංවර්ධනමය අවශ්‍යතාවයන් ලබා නොදීම මගින් මෙම අපයෝජනය සිදු වේ. නොසලකා හැරීම විවිධ අයුරින් සිදුවෙයි.

1. කායික නොසලකා හැරීම

දරුවන් හිතාමතා පෝෂණය නොකර සිටීම, රෝගී වූ විට ඖෂධ ලබා නොදීම, හෝ වෛද්‍යමය නොසලකා හැරීම, සමාජ හා ශාරීරික අනතුරු වලින් දරුවන් ආරක්‍ෂා නොකිරීම කායික නොසලකා හැරීමයි.

2. චිත්තාවේගාත්මක නොසලකා හැරීම

දරුවන්ට අවශ්‍ය ආදරය හා සෙනෙහස ලබා නොදීම.

3. අධ්‍යාපනික නොසලකා හැරීම

දරුවන් අධ්‍යාපනික කටයුතු සඳහා ධෛර්යමත් නොකිරීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා නොදීම හෝ දරුවන්ගේ මූලික අයිතිවාසිකමක් වන අධ්‍යාපනය ලැබීම පවා සීමා කිරීම මෙහිදී සිදු වේ.

දරුවකු නොසලකා හැරීමේ අවසාන ප්‍රතිඵලය දරුවන්ගේ මරණය වුව ද විය හැක. නොසලකා හැරීම මගින් දරුවන් අනෙක් සියළු අපයෝජනයන්ට ගොදුරු වීම සිදුවීමේ ප්‍රවනතාවය අධික බවක් හඳුනා ගත හැකිය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් දරුවන්ගේ රැකවරණය හා ඔවුන් පිළිබඳ අවධානයෙන් සිටීම දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ වගකීම වෙයි. ඉහත අපයෝජන ප්‍රබේදයන්ට අමතරව උපයෝජනය නැතිනම් දරුවන්ගේ ශ්‍රමය සූරා කෑම, දරුවන් විකිණීම හෝ වාණිජ අරමුණු සඳහා යොදා ගැනීම යනාදිය ද අපයෝජන ප්‍රබේදයන්ට අයත් වේ යැයි කිව හැක.

**ශ්‍රී ලාංකාවේ ළමා අපයෝජනය සම්බන්ධ තත්ත්වය**

ශ්‍රී ලාංකේය සමාජයෙහි ළමා අපයෝජනය සම්බන්ධයෙන් ඇති සංඛ්‍යා දත්ත පිළිබඳව විමසා බැලීමේදී, ළමුන්ට එරෙහිව සිදුවන අපයෝජනයන්හි ස්වභාවය තරමක් දුරට හඳුනා ගත හැක.

ළමුන්ට එරෙහි බල අපරාධ සාරාංශය - 2012

| වරද | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| මිනී මැරීම | 44 | 42 | 40 | 29 | 27 | 16 |
| මිනී මැරීමට තැත් කිරීම | 32 | 13 | 11 | 15 | 11 | 3 |
| බරපතල තුවාල සිදු කිරීම | 45 | 52 | 46 | 34 | 48 | 26 |
| කුට්ටනය | 14 | 25 | 21 | 11 | 11 | 7 |
| ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 44 | 29 | 31 | 25 | 25 | 5 |
| පැහැරගෙන යාම | 125 | 78 | 95 | 95 | 57 | 25 |
| අපහරණය | 406 | 367 | 352 | 451 | 551 | 318 |
| ස්ත්‍රී දූෂණය | 805 | 914 | 922 | 1089 | 1169 | 557 |
| අස්වාභාවික වැරදි | 16 | 10 | 7 | 9 | 16 | 5 |
| තැනැත්තන් වෙළඳාම් කිරීම | 5 | 5 | 4 | 11 | 6 | 1 |
| බරපතල ලිංගික අපයෝජන | 512 | 512 | 520 | 571 | 604 | 291 |
| ව්‍යාභිචාරය | 15 | 18 | 8 | 17 | 11 | 9 |
| කෲරත්වය පත් කිරීම | 120 | 107 | 96 | 100 | 99 | 28 |
| එකතුව | 2204 | 2187 | 2162 | 2481 | 2651 | 1296 |

(මූලාශ්‍රය - ළමා හා කාන්තා කාර්යාංශය-2012)

මෙහි සඳහන් වන්නේ ළමුන්ට එරෙහිව සිදුවන අපයෝජනයනන්හි කොටසක් පමණි. විශේෂයෙන්ම ස්ත්‍රී දූෂණය, අපහරණය, බරපතල ලිංගික අපයෝජනය යන අපරාධයන්හි වර්ධනයක් මෙම අවුරුදු කිහිපය තුළම දැකගත හැක. කුමන රටක වුව ද කොපමණ ළමුන් ප්‍රමාණයක් අපයෝජනය වී ඇත්දැයි නිශ්චිතව දැක්විය හැකි සංඛ්‍යා ලේඛන නොමැත. එයට ප්‍රධානතම හේතුව වන්නේ, බොහෝ අපයෝජන සිදුවීම් විවිධ හේතු සාධක මත නීතිය හමුවට නොපැමිණ යටපත් වීමයි. ඒ අනුව සමාජයේ නීතිය හමුවට පැමිණි සිදුවීම් සංඛ්‍යාවට වඩා වාර්තා නොවුණු සිදුවීම් ප්‍රමාණය අධික විය හැක. 2012 වර්ෂයේ පොලිස් කොට්ඨාශ මට්ටමින් ළමුන්ට එරෙහි සුළු සහ බල අපරාධ පිළිබඳව විමසා බැලීමේදී ද ළමා අපයෝජනයේ ස්වභාවය සම්බන්ධ දළ අදහසක් ලබා ගත හැක.

පොලිස් කොට්ඨාශ මට්ටමින් ළමයින්ට එරෙහි සුළු සහ බල අපරාධ - 2012

| පොලිස් කොට්ඨාය | සුළු අපරාධ | ගහණ අපරාධ |
|---|---|---|
| අනුරාධපුරය | 19 | 92 |
| අම්පාර | 12 | 34 |
| බදුල්ල | 48 | 21 |
| බණ්ඩාරවෙල | 18 | 13 |
| කොළඹ (උතුර) | 4 | 15 |
| කොළඹ (දකුණ) | 4 | 03 |
| කොළඹ (මධ්‍යම) | 13 | 08 |
| හලාවත | 14 | 32 |
| ඇල්පිටිය | 20 | 21 |
| ගාල්ල | 27 | 49 |
| ගම්පහ | 40 | 31 |
| ගම්පොළ | 9 | 18 |

| | | |
|---|---|---|
| යාපනය | 7 | 21 |
| කළුතර | 12 | 34 |
| කැලණිය | 12 | 24 |
| මහනුවර | 27 | 57 |
| කෑගල්ල | 13 | 43 |
| කුරුණෑගල | 27 | 44 |
| කුලියාපිටිය | 21 | 46 |
| කන්තලේ | 9 | 16 |
| මාතලේ | 28 | 51 |
| මාතර | 27 | 56 |
| ගල්කිස්ස | 10 | 49 |
| මොනරාගල | 17 | 22 |
| මීගමුව | - | 22 |
| නුගේගොඩ | 20 | 32 |
| නුවරඑළිය | 11 | 15 |
| නිකවැරටිය | 13 | 30 |
| රත්නපුරය | 16 | 69 |
| තංගල්ල | 21 | 61 |
| ත්‍රිකුණාමලය | 11 | 16 |
| පොළොන්නරුව | 23 | 60 |
| පානදුර | 26 | 22 |
| මඩකලපුව | 15 | 22 |
| වව්නියාව | 06 | 13 |
| හැටන් | 03 | 05 |
| කන්කසන්තුරේ | 04 | 08 |
| මාන්කුලම් | 02 | 08 |
| කිලිනොච්චිය | 07 | 09 |
| මුලතිව් | - | 08 |
| පුත්තලම | 17 | 21 |
| සීතාවක | 17 | 37 |
| ළමා කාන්තා කාර්යංශය | 46 | 02 |
| ළමාරක්ෂක අධිකාරිය | 22 | 25 |
| එකතුව | 731 | 1296 |

(මූලාශ්‍රය - ළමා හා කාන්තා කාර්යාංශය-2012)

මෙම සංඛ්‍යා ලේඛන වලට අනුව 2012 වර්ෂයේ මුල් මාස 06 තුල ළමා අපයෝජන සිදුවීම් වැඩියෙන්ම වාර්තා වන පොලිස් කොට්ඨාශ ලෙස අනුරාධපුරය, රත්නපුරය, තංගල්ල හඳුන්වා දිය හැකිය. සමස්තයක් ලෙස සලකා බලන විට වර්තමානයේ පෙර නොවූ අන්දමින් ළමා අපයෝජන සිදුවීම් වාර්තා වේ. මීට අමතරව, 2011 වසරේදී ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමාරක්ෂක අධිකාරියට පැමිණිලි 5801 ලැබී තිබුණි. නමුත් 2012 වසරේ ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාස වලදී දරුවන් සම්බන්ධ පැමිණිලි 9446 ක සංඛ්‍යාවක් ලැබී තිබේ. ඒ අතරින් පැමිණිලි 1361ක් ළමා අපයෝජනය සම්බන්ධ පැමිණිලි වන අතර ළමයින්ට එරෙහි කෲරත්වය සම්බන්ධ පැමිණිලි 218ක්, බරපතල ලිංගික අපයෝජනය සම්බන්ධ පැමිණිලි 84ක් මීට ඇතුළත් වේ. උක්ත කරුණු අනුව 2011 වසරේදී ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමාරක්ෂක

අධිකාරියට පැමිණිලි 5801ක් පමණ ලැබී තිබූ අතර 2012 වසරේ පළමු මාස 03 ඇතුළත ලැබී ඇති පැමිණිලි සසඳන විට එය පැමිණිලි 4338 ක සීඝ්‍ර වැඩි වීමකි. එය ඉකුත් වසරට සාපේක්ෂව 8% ක වර්ධනයක් වන අතර අනුරාධපුරය, කොළඹ, ගම්පහ, ගාල්ල, කුරුණෑල, කළුතර, රත්නපුරය යන දිස්ත්‍රික්ක වලින් පැමිණිලි වැඩි වශයෙන් ලැබී තිබෙයි.

ළමා අපයෝජනය මේ අයුරින් සමාජය තුළ වර්ධනය වීමට බොහෝ හේතු සාධකයන් පවතී. නූතනයේ පර්යේෂණ මගින් අපයෝජකයින් පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගෙන ඇත. සෑම විටම අපයෝජකයෙහි යෙදෙන්නා සාමාන්‍ය ගති ලක්ෂණ පෙන්නුම් කළ ද මානසික ව්‍යාධියෙකි. එම ව්‍යාධි ලක්ෂණ සෑම අවස්ථාවකම නොපෙන්නුව ද අපයෝජනයට අදාල පසුබිමකදී ව්‍යාධි ලක්ෂණ මතුවී අපයෝජකයෙහි යෙදෙන බව සොයාගෙන ඇත. එබැවින් අපයෝජකයින් දෛනික ජීවිතය සාමාන්‍ය ආකාරයෙන් ගත කළ ද මානසික විකෘතිය සුදුසු තැන ක්‍රියාවට නැංවේ. සෑම පුද්ගලයෙක්ම අපයෝජකයෙක් නොවන අතර අපයෝජකයින් හඳුනාගැනීම අපහසු ක්‍රියාවක් වනුයේ ඔවුන් සාමාන්‍ය පුද්ගලයින් අතර සාමාන්‍ය ලෙස කටයුතු කරන බැවිනි. පවුලේ සෙනෙහස ආරක්ෂාව සංස්කෘතිය මගින් ළමයෙකු කුඩාකල සිටම ආරක්ෂා කළ ද මොවුන්ට එසේ නොලැබීම, අපයෝජනවල යෙදීමට මූලික පසුබිම සකස් කර දී තිබේ. එපමණක් නොව පවුල ප්‍රචණ්ඩකාරී නම් මත්පැන් භාවිතා කරන සමාජ විරෝධී ක්‍රියා කරන ඉතා දුගී නූගත් අය වීමත් සමඟ පවුල ප්‍රචණ්ඩ වේ. ප්‍රචණ්ඩතාව මත හැදෙන බොහෝ දරුවන්ද ප්‍රචණ්ඩ වන බව සොයාගෙන ඇත.

මේ අයුරින් විවිධ ස්වරූපවලින් ළමා අපයෝජකයින් සමාජය තුළ සැරිසරන මුත් හඳුනා ගැනීම අපහසුය. අතීතයට වඩා වර්තමානයේ ළමා අපයෝජන බහුල වී ඇත. ලොකයේ විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සමඟ මිනිසා පත්ව ඇති අවිවේකී බව මානසික පීඩනය නිදහස සීමා වීමට හේතුවෙයි. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජකයින් බිහිවීමට බලපාන තත්ත්වයන් මෙසේය.

1. නිදහස සීමාවීම (අවිවේකි බව)
2. මානසික පීඩනය
3. අවිවාහක බව
4. නිසි වයසට විවාහ වීමට නොහැකි වීම
5. ලිංගික පීඩනය (සුපුරුදු ලිංගික සුවය ලබා ගැනීමට නොහැකියාව)
6. යහපත් ළමා වියක් නොලැබීම
7. මත් ද්‍රව්‍ය භාවිතය

(කුරේ, 2007)

නිදහස සීමා වීම විවිධ ආකාරයට සමාජයේ සිදුවෙයි. ව්‍යාපාර හා රැකියා නිවසේ අවිවේකී බව දැඩි නීති රීති හා පුද්ගල ආධිපත්‍ය සිරගත වීම මෙන්ම විවිධ ව්‍යාපෘති වැඩකටයුතු වගකීම් හේතුවෙන් පුද්ගලයින්ගේ නිදහස සීමා විය හැකිය. බන්ධනාගාරවල රැඳවියන් අවුරුදු ගණන් සිරකර තැබීමෙන් ඔවුන් මානසික හා ලිංගික වශයෙන් පීඩනයට ලක්ව සමලිංගිකත්වයට යොමු වේ. මොවුන් නිදහස්ව පැමිණි පසුවද හුරු පුරුදු අතහැර ගැනීමට නොහැකිව සමාජයේ පිරිමි දරුවන් තම ආශාවන් ඉටුකර ගැනීමට යොදා ගනිති. රැකියා ව්‍යාපාර හේතුවෙන් නිදහස සීමාවන පුද්ගලයින් පීඩාකාරී මනසකින් දිවි ගෙවති. මෙවැනි පිරිමින් මෙම පීඩාවලින් මිදීමට සුලබව මත්පැන් දුම්වැටි භාවිතා කරයි. මෙවැනි පීඩාකාරී මනසකින් යුත් පුද්ගලයන් වෙසෙන නිවසක වසන මෙහෙකාර දරුවන් මෙන්ම නිවසේ දරුවන්ද විවිධ හිරිහැරවලට මුහුණ පාති. ව්‍යාපාර හා විධායක ශ්‍රේණියේ රැකියාවල නියුතු පුද්ගලයන්ගේ පහර දීම, පිළිස්සීම, නිරාහාරව තැබීම වැනි පීඩාවන්ට පත්වූ දරුවන් පිළිබඳ සුලබව වාර්තා වී ඇත.

### අපයෝජනය නිසා ළමා වින්දිතයින් අත් විඳින ප්‍රතිඵල

කිසියම් අපයෝජනයකට ගොදුරු වූ ළමයෙකු විෂයෙහි ඇති කරන්නා වූ බලපෑම කෙටිකාලීන මෙන්ම දිගුකාලීනව හානිකර ප්‍රතිඵල ඇති වන්නේය. අභ්‍යන්තරික වශයෙන් එය අපයෝජනයට ලක් වූ ළමයාට පමණක් නොව ඔහු අයත් සමාජයට ද බලපානු ලබයි. අපයෝජනය නිසා

ළමුන්ගේ ශාරීරික මානසික හා පෞරුෂ වර්ධනය සම්බන්ධයෙන් ඉතාමත් දැඩි අහිතකර ප්‍රතිඵල ඇති වේ. ළමයාගේ වයස, අපයෝජනයේ ස්වරූපය (ශාරීරික, ලිංගික, මානසික වශයෙන්) අපයෝජනය සිදු කළ පුද්ගලයා අපයෝජනයට ගොදුරු වූ කාල පරාසය හා වාර ගණන දරුවාගේ දරාගැනීමේ හැකියාව මත අපයෝජනයේ කෙටි කාලීන දිගු කාලීන බලපෑම්වල ස්වභාවය වෙනස් වේ. දරුවාගේ පෞරුෂ තත්ත්වය මත අපයෝජන දරා ගැනීමේ හැකියාව වෙනස් වන බැවින් එකම අපයෝජන සිදුවීමට දරුවන් විවිධ ප්‍රතිචාර දක්වයි.

අපයෝජනය සිදුවන විට දරුවාගේ වයස අඩු නම් අපයෝජනයෙන් දරුවාට සිදුවන හානිය වැඩිය. පියා, මව, ඥාතියෙකු වැනි දරුවාට සමීප පුද්ගලයෙකු වෙතින් අපයෝජනයට ලක්වීමට වඩා භයානකය. දරුවාට තමාට සිදුවූ අපයෝජන සිදුවීම ප්‍රකාශ කළ විට දරුවාට ලැබෙන ප්‍රතිචාර ද වැදගත් වේ. නූතන පර්යේෂණ මගින් සොයා ගෙන ඇති පරිදි එවැනි අවස්ථාවක ඔහුට ලැබෙන ප්‍රතිචාරය ළමයා ලැජ්ජාවට, සැකයට, නොසලකා හැරීමට, දෝෂාරෝපණයට ලක්වේ නම් අපයෝජනයෙන් සිදු වූ හානියට වැඩි හානියක් ඉන් දරුවාට සිදුවන බවය. එමෙන්ම ළමයා අපයෝජනයට මුහුණ දුන් කාලසීමාව වැඩිනම් අපයෝජනය තුළ සිදුවූ ප්‍රචණ්ඩත්වය ඉහළ නම් වින්දිතයාට සිදුවන හානිය ඉහළය.

අපයෝජනයකට ලක් වූ දරුවන් තුළින් පහත ගති ලක්ෂණ හා හැසිරීම් රටා හඳුනාගත හැකිය.

- කායික වශයෙන් ළමුන්ගේ වර්ධනය හීන වීම
- දියවැඩියාව ආසාත්මිකතාව නැතහොත් යම් ද්‍රව්‍යක් ශරීරයට අගුණ වීම
- හැසිරීම් රටාව හරිහැටි පැහැදිලි නොවීම හෝ වරින් වර වෙනස් වීම
- ඇතැම් පුද්ගලයින්ට හෝ දේවලට ප්‍රතිචාර නොදැක්වීම
- උදාසීන බව (අධ්‍යාපනයට හෝ වෙනත් බාහිර ක්‍රියාවන්ට මැලිවීම
- නිතර බියට පත් වීම, තිගැස්සීම හෝ වරින් වර වේදනාවෙන් කෑ ගැසීම
- නිතර නිතර මූත්‍රා හෝ මළපහ පිට කිරීම, නිතර නිතර නිදා ගැනීම
- ශරීරය කෙසඟ වීම, ඇස් ගිලීම, කම්මුල් වල ගැසීම, හක්ක ඉදිරියට එල්ලීම,

  ශරිරයේ අනෙක් කොටස්වලට වඩා ඔලුව විශාල වීම, ශරීරය වක ගැසීම
- නිතර ශරීරය කැසීම, ඇඟ ඇඹිරීම
- හුදකලා වීම හෝ මුලු ගැන්වීමට උත්සාහ ගැනීම, කල්පනාවේ යෙදීම
- තරහ යාම, ඇසුරු කරන්නන් මග හැරීම
- වැඩිහිටියන්ට මුහුණදීමට අකමැති වීම, ගුරුවරුන්ට මුහුණදීමට අකමැති වීම
- ඕනෑවට වඩා පිරිසිදුව සිටීම, වරින් වර ඇඳුම් මාරු කිරීම

(පෙරේරා, 2011, පි.79-80)

ඉහත ප්‍රතිචාරයන් දැක්වීම තුළ දරුවන් කුමන ආකාරයේ මානසික, ශාරීරික පීඩාවන්ට පත් වී ඇත්දැයි හඳුනා ගත හැකි අතරම එම ළමුන්ගේ සමාජ ජීවිතය එතැන් පටන් අඩාල වීමේ වැඩි ප්‍රවනතාවයක් පවතී. ළමා අපයෝජනය පිළිබඳ අත්පොතෙහි අපයෝජනයට පත් වූ ළමයින්ගේ මානසික තත්ත්වයෙහි ඇතිවන වෙනස් වීම් මෙලෙස පෙන්වා දී ඇත.

- ඉමහත් බියෙන් කාලය ගත කිරීම
- මානසික බිය හා පීඩනය හේතුවෙන් විවිධ ආකාරයේ ශාරීරික රෝග ලක්ෂණ මතුවීම
- පවුලේ සාමාජිකයන්ගෙන් සහ තමා ඇසුරු කරන පුද්ගලයන්ගෙන් ඈත් වී හුදකලාවීම

- එදිනෙදා කරන කටයුතු වලින් ඉවත්වීම නිදසුනක් වශයෙන් පාසැල් යාමට ප්‍රිය නොවීම
- අපයෝජනයට ගොදුරු වූ වයසින් වැඩි ළමයින් තුළ අනාගතය පිළිබඳ බලාපොරොත්තු බිඳ වැටීම
- ළමයාගේ අධ්‍යාපන කටයුතු ඉතා සීඝ්‍රයෙන් පහත වැටීම
- ළමයා පාලනය කරගත නොහැකි ආකාරයෙන් ඉතා මුරණ්ඩු ලෙස හැසිරීම
- ඉක්මනින් කේන්ති යාම සහ කිසිවෙකු නොරිස්සීම

(ළමා අපයෝජනය පිළිබඳ අත්පොත, 1995, පි.13)

ළමා අපයෝජනය තුලින් ළමයාට සිදුවන බරපතල හානිය මෙයින් හඳුනා ගත හැක. දරුවන් මෙවන් අපයෝජන තත්ත්වයන්ගෙන් අරක්‍ෂා කර ගැනීමට කටයුතු කිරීම වැඩිහිටියන්ගේ වගකීමකි.

ශ්‍රී ලංකාවේ අපයෝජන සිද්ධීන්ට දශක 30ක් පුරා පැවති යුදමය වාතාවරණය, දිළිඳුකම, සංචාරක ව්‍යාපාරය, විවෘත ආර්ථිකය යනාදී හේතු සාධක බලපා තිබෙයි. නමුත් වත්මන් ශ්‍රී ලාංකේය සමාජ සංදර්ශනයෙහි ළමා අපයෝජනය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන බව මේ දිනවල පුවත්වලින් හෙළිවෙයි. නිදසුනක් ලෙස දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචි සේයා සදෙව්මි දැරියගේ අපයෝජනය ඇතුළු ළමා අපයෝජන සිදුවීම් කිහිපයම සමාජයේ මිනිසුන් අපරාධයන්ට එරෙහි අවධි කිරීමක් ලෙස පෙන්වා දිය හැකිය.

**සමාලෝචනය**

ළමා අපයෝජනය මගින් දරුවකු හට සිදුවන බරපතල හානිය ඔවුන්ගේ අනාගතය පවා විනාශ කරන්නකි. ඒ හේතුවෙන් දරුවන්ගේ අයිතිවාසිකම් සුරකීම, ඔවුන්ට ආරක්ෂාව සැලසීම දෙමාපියන්, භාරකරුවන්ගේ වගකීමක් වනු ඇත. එහෙත් වාර්තා වන ළමා අපයෝජනයන්ට වඩා වාර්තා නොවන අපයෝජනයන් සංඛ්‍යාව අධික විය හැකිය. දකුණු ආසියාතික රටක් වශයෙන් ශ්‍රී ලංකාවට හිමිව ඇති සංස්කෘතිකමය ස්වභාවය එයට හේතුව වේයැයි සඳහන් කළ හැකිය. කෙසේ වුවත් වත්මන් සමාජයේ ළමා අපයෝජනයේ ස්වභාවය පිළිබඳව අවබෝධයක් තිබුණ ද නොදැනුවත්වම ළමා අපයෝජනය සිදුවන බැව් පිළිබඳව බොහෝ පිරිසකට දැනුවත් භාවයක් නොමැත. එසේම මෙම අපයෝජන සිදුවීම් පිළබඳව ජනතාව තුළ දැනුවත් භාවයක් ඇති කිරීම සහ ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ යුතු ආයතන පිළිබඳව අවබෝධයක් ලබා දීම වැදගත් වේ. ප්‍රමුඛ වශයෙන් සෑම පොලිස් ස්ථානයකට දැනුම් දිය හැකි අතර එහි ඇති ළමා හා කාන්තා ඒකකය මෙන්ම ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශය ක්‍රියාත්මක වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Corby, P (2000), Child Abuse ( 2nd edition), Open University Press, New york.

Korbin J. (Ed) (1981), Child Abuse and Niglect: Cross Cultural perspectives, University of California Press, Berkeley.

Oxford Pocket Dictionary (1994), Oxford Univesity Press, Newdillhi.

Stark, Rodney (1975), Social Problems, Random House, New York.

අමරසේකර, දයා (2005), ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න, ආරිය ප්‍රකාශකයෝ, වරකපොළ.

අමරසේකර, දයා (1996) ශ්‍රී ලංකා සමාජයඃ සමාජ විද්‍යාත්මක විමසුමක්, ආරිය ප්‍රකාශකයෝ, වරකපොළ.

කුරේ, කේ, එන් (2007), ශ්‍රී ලංකාවේ සිදුවන ළමා අපයෝජන, ආරිය ප්‍රකාශකයෝ, වරකපොළ.

කුමාර, ඩබ්. ඒ, (2001), ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන, පීස් ප්‍රකාශන, කොළඹ.

පෙරේරා, ස්වර්නලතා (2011) සමාජ ප්‍රශ්න, කර්තෘ ප්‍රකාශන.

වත්තේ ආරච්චි, එස්. එල්. (2001), ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන ඃ සෑම ළමයෙක්ම දරුවෙකි, කොළඹ.

ළමා අපයෝජනයට වැට බඳිමු (1995), ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

ළමා අපයෝජනය පිළිබඳ අත්පොත (1995), ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (1989), එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය.

www.childprotection.gov.lk

www.linkedin.com/pulse/child-abuse-sri-lanka-child-rehabilitation-centre

www.pandys.org/whatissexualabuse.html

http://www.medicinenet.com/script/main/art.asp?articlekey=8439